# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# නර්තනය
# 11 ශ්‍රේණිය



## අධ්‍යාපන සංවර්ධන අංශය

## කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**

ශ්‍රීමලි කපුරුපක්ෂ - ගුරු උපදේශක

වරුණි බාලසූරිය - ගුරු උපදේශක

**සියලු හිමිකම් ඇවිරිණි**

**ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටාගන්නා ලදී**

## ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ගායනාවල පසුබිම




**ජන ගායනා හා බැඳී සංස්කෘතික පසුබිම :**

W. B. මකුලොලුව මහතා ගේ "හෙළ ගී මග" නම් ග්‍රන්ථයේ ගැමි ගීතය හා ගැමි සංගීතය පිලිබඳව මෙසේ දක්වා ඇත. "අධ්‍යාපනයකින් හෝ ශිල්පීය පුහුණුවකින් සංස්කෘතික සංවර්ධනය නො සැලසුණු පොදු ජනයා ගේ සහජ කලා කෞශල්‍යය හේතු කොටගෙන අනායාසයෙන් නිර්මාණය ලත් ගී, ගැමි ගී නමින් හැඳින් වේ. ගැමි ගී යනු පොදු ජනයාගේ ගීතයයි. පුරාවෘත්තයන් හෝ ඓතිහාසික සාමාන්‍ය ජීවිතයේ සිද්ධීන් අළලා රචිත වචන සහ සාමාන්‍යයෙන් නාද මාලාව ද පොදුජනයා තුළින්ම සම්භවය ලත් අතර බහුල ලෙස භාවිත වන්නාවූ ගීත ගැමි ගී නම් වේ".

ජන ගීය මූලික වශයෙන් සේ ගී හා ගැමි ගී යනුවෙන් වෙන්කොට දැක්විය හැක. ගැමි ගී හා සේ ගී ඒවායේ ප්‍රස්තුතය අනුව නැවත වර්ග කර ගැනීම හැදෑරීමේ පහසුවට යෝග්‍යය.

**බැති ගී**: භක්ති රසය විදහාපාන ගී, භක්ති ගී නම් වේ. මෙහි ආගමික පසුතලයක් ඇත. ගුරු දෙගුරුන්, වැඩිහිටියන්, දෙවියන් පිදීමෙහි එන ගී ද මේ ගණයට අයත් වේ.

**යාග ගී**: බලි තොයිල් ආදී ශාන්ති කර්ම සමග ගැයෙන ගී යාග ගී නම් වේ.

**මෙහෙ ගී**: ජීවන වෘත්තීන් හා සබැඳුණු ගී මෙහෙ ගේ නම් වේ. ගොවිකම්, කම්මල් කම්, වෙනත් අකුඹල් කම්, ගැල් පැදවීම් ආදී ජීවන වෘත්තීන් සමග ගැයෙන ගී මෙහෙ ගී ගණයෙහි ලා ගැනේ.

**සමාජ ගී**: ජීවන වෘත්තීන් හා නොබැඳුණු එහෙත් ජීවිතයේ අවස්ථා සඳහා භාවිත ගී සමාජ ගී නම් වේ. දරු නැළවිලි ගී, මගුල් ගී, අවමගුල් ගී, තුති ගී, වැනුම් ගී, පෙම් ගී ,වැලපුම් ගී, මැසිවිලි ගී ආදිය මේ වර්ගයට අයත් වේ.

**කෙලි ගී**: ක්‍රීඩා සමග භාවිතයේ එන ගී කෙලි ගී නම් වේ. එළුවන් කෑම, ඔන්චිලි පැදීම, මේවර සෙල්ලම, අං ඇදීම, පොර පොල් ගැසීම, හවරි හැංගීම ආදී ක්‍රීඩා සමග ගැයෙන ගී මේ ගණයට අයත් වේ.

**නළු ගී**: නැටුම් සමග භාවිත ගී නළු ගී නම් වේ. පන්තේරු, උඩැක්කි, රබන්, වන්නම්, කලගෙඩි, ලී කෙළි ආදී නැටුම් සමග යෙදෙන ගී මේ ගණයට අයත් වේ.

**විරුදු ගී**( ප්‍රශස්ති): පුද්ගල වර්ණනාව සඳහා භාවිත ගී විරුදු ගී ලෙස හඳුන්වයි. ප්‍රශස්ති යනු මෙයට කියන තවත් නමකි.

**රණ ගී:** සටන් කටයුතු ගී හා සටන් වැනුම් ගී රණ ගී නම් වේ ඉංග්‍රීසි හටන ආදී හටන් වල එන ඇතැම් ගී මේ ගණයෙහි ලා වැටෙයි.

**වැනුම් ගී**: ස්වභාව සෞන්දර්යේ හෝ වෙනත් වර්ණනා පැවසෙන ගී වැනුම් ගී ගණයට වැටේ.

**11 ශ්‍රේණියේ දී ඉගෙන ගැනීමට ඇති ගායනා පිළිබඳව මීළඟට විමසා බලමු.**

**හටන් කවි**: ඓතිහාසික සටන් පසුබිම් කරගෙන ගොඩනැගී ඇති මෙම හටන් කවි සටනට යාමට පෙර යුද්ධ ගමනේ දී, යුද කරන අවස්ථාවේ හා යුද්ධයෙන් පසු අවස්ථා පසුබිම් කරගෙන සටනේ වීරත්වය ඉස්මතු වන පරිදි මෙම ගායනා රචනා වී තිබීම විශේෂත්වයකි. උදාහරණ ලෙස ලන්දේසි හටන, පෘතුගීසි හටන, ඉංග්‍රීසි හටන, දුනුවිල හටන, කොන්ස්තන්තීනු හටන දැක්විය හැක.

**යුද්දෙටත් ඇවිත් සිදුපිට නැව් නැගිලා පරංගි**

**උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැහැලා**

**අන්දමත් හොඳයි කිසි බිසී ගාලා කොළඹ දී**

**කම් පලත් නැතත් සෙනගත් මරා දාලා**

**ලත් තැනින් කියත් බාසෙන් රට ගන්ටා දෙමළු**

**මත් වෙලත් දොඩත් වෙරිමත පෙන්වන් ටා**

**කත් ගෙරිත් මසුත් උන්ගේ කුණු පණු යන්ටා ළමැද**

**රත් වෙලත් ගිනිත් සියොළඟ බැරි උන්ටා**

**(පරංගි හටන)**

**මෝල් ගස් කවි:** මෝල් ගස් නැටුම මැතකදී ගැමි නැටුම් වලට එක්වී ඇත. ඒ සඳහා ශාන්තිකර්ම වල එන අටමගලේ කවි යොදාගැනේ. මෙහිදී මෝල් ගස් වල ස්වභාවය එම කවිවලින් විස්තර කෙරේ. වර්තමානයේ මෝල් ගස් නැටුම ප්‍රසංග වේදිකාව සඳහා නිර්මාණය වීමත් සමගම විවිධ මෝල් ගස් කවි ද රචනා වී තිබේ.

**දිව් කඳුරුද ගස එතැන තියෙන්නේ**

**සත් වියතක් දිග මොහොල කපන්නේ**

**රන් විලි දෙකොනට සොඳින් තනන්නේ**

**සත්දින දොස හැර දෙ පා තබන්නේ**

**රනේ රුව සෙ වත රුවින් දිලේ දෝ**

**රනේ බරණ ගත වට සරසා දෝ**

**රනේ ඔසරිපොට නෙරිය තබා දෝ**

**රණේ දෙකොන විලි මෝල ගෙනේ දෝ**

**ග්‍රහ පන්ති කවි:** රවි, චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, රාහු, කේතු යනුවෙන් දැක්වෙන නවග්‍රහයන්ගෙන් සිදුවන්නා වූ අපල උපද්‍රව දුරු කරගැනීම සඳහා කරනු ලබන බලි ශාන්තිකර්මය උඩරට, පහතරට සහ සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනට ම පොදු වූ ශාන්ති කර්මයකි. එකී ශාන්තිකර්මයේ එන කවි ග්‍රහපන්ති කවි ලෙස හැඳින්වේ. නව ග්‍රහයන්ට අයත් දිශා, විමාන(වෘක්ෂ), ආයුධ, භෝජන, වාහන, දින පිළිබඳව මෙම ගායනාවල සඳහන් වී ඇත. ඇදුරා, බෙර වාදනයට අනුව දකුණු අතට අත්මිණිය ගෙන තාලානුකූල ව ගායනා කරමින් සරල නර්තනයක යෙදේ. මෙම ගායනා මගින් ග්‍රහයන්ට ආරාධනා කිරීම හා ආතුරයාට සෙත් පැතීම සිදු කරනු ලැබේ.

**ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට හිරුදෙව අධිපති වන් නේ**
**රන් සිරිවස ගෙන සුරත දරාගෙන තුරගෙකු පිට වැඩ ඉන් නේ**
**ඇති යම් රෝ දුක් දුරැර දමා නිති චිරත් කලක් වැජඹෙන් නේ**
**ඉන්ද්‍ර දිසාවෙන් හිරු දෙවි වැඩලා ග්‍රහ මේ දොස දුරලන් නේ**

**කොකුම් පාට කිතුලින් බත් වළඳා ඉඳුරට හිමි ව න**
**අතින් රැගෙන සිරිවසකුත් තුරඟුන් නැගී ඉඹුල් විම න**
**නිතින් පැමිණ එන උවදුරු ඉරිදා මුල්කොට අරගෙ න**
**දුකින් මුදා සැපත ලැබෙයි ඉරු සෙත් දී ආවඩව න5**

**පන්තේරු කවි :**




උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පන්තේරු නර්තනය සබරගමු නැටුම් විශේෂයක් ලෙස හැඳින්විය හැකියි. එහි දී ගැයෙන කවි පන්තේරු කවි ලෙස හඳුන්වනු ලබයි. අතීතයේ විහාර පන්සල් වල කෙරෙන සූවිසි විවරණ සත් සති වැනි ආගමික උත්සව අවස්ථාවන්හිදී බුදු ගුණ ගායනා කරමින් නර්තනය කර ඇත. පන්තේරුව අතට ගන්නෙ පත්තිනි දේවියගේ අවසරය ඉල්ලා ගෙනයි.

සිත් ලෙස ලොව සැදී චක්‍ර වල ල්ලා
නෙත් තුන සුරිඳුගේ නුවරු සිය ල්ලා
පත්තිනි දෙවිඳුගේ සළඹ වල ල්ලා
ගත්තෙ අතට පන්තේරු වල ල්ලා

**ප්‍රශස්ති:** රජුන් මැති ඇමැතිවරුන් සහ ප්‍රභූන් ගේ වීර වික්‍රමාන්විත ක්‍රියා, ත්‍යාගශීලී බව, පෞරුෂ ලක්ෂණ වැනි ගති වර්ණනා කරමින් කාව්‍ය රචනා කර ඔවුන් ඉදිරියේ ගායනා කරන ලදී. මේවා ප්‍රශස්ති නමින් ප්‍රචලිත අතර මහනුවර යුගයේදී වඩාත් ජනප්‍රිය කලාවක් විය. රාජ සභාවේ කවිකාර මඩුවේ දී වන්දිභට්ටයන් විසින් මෙම ගීත ගායනා කර ඇත. මෙහි අර්ථ රසය ට වඩා ශබ්ද රසයට ප්‍රමුඛත්වයක් දී ඇත. සංස්කෘත වචන බහුලව යෙදෙන මිශ්‍ර සිංහල භාෂා ශෛලියක් මෙම ගීත රචනයෙහි තිබීම විශේෂ ලක්ෂණයකි.

බුදුරජාණන්වහන්සේ ගේ ගුණ වර්ණනා කරන “බුද්ධ ප්‍රශස්ති” ද දෙවි දේවතාවුන් ගේ ගුණ වර්ණනා කරන දේව ප්‍රශස්ති ද ඇත. අප පාඩමේ ඇත්තේ “රාජ ප්‍රශස්ති”ය.

පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම
බානා පියෙවු බලති තුංක මේ
නූනා වැළඳි කමල යානා සඳෙ ද සදෙව්
වීනා සපිරි සිරිනි සංඛ මේ
පීනා සමර සයුර නානා නතන නතබ
ගානා තෙදිගු නෙතග කුංකු මේ
සේනා සමග මෙලක නානා සිරින් පවතු
බුවනාදිපති රාජසිංහ මේ

**චන්දනම් යස තේජ කුංකුම**
**ඇන්ද දිග ගණන් උරතල**
**බින්ද සතුරු අඳුරු පැහැර**
**බන්ධුකමල සේ**

**රාම චන්ද්‍ර විය රිවි කුල**
**නාම ගගන තල බබලන**
**රාජ මෙතුම් සිංහල කිවි**
**බෝජ රාජනේ**

**නන්ද විජය ශ්‍රී වික්‍රම**
**රාජසිංහ නම් අප හිමි**
**ඉන්ද්‍රසිරින් නිති රැක දෙන්**
**කන්ද කුමරුනේ**

**තේජ විකුම් යුතු වික්‍රම**
**රාජසිංහ සිරි නම් දැරු**
**රාජ රත්නමය අප හිමි**
**රාජ රාජ නේ**

ලංකාවේ පැරණිම ප්‍රශස්ති කාව්‍ය ලෙස සැලකෙන්නේ පැරකුම්බා සිරිතයි. ශ්‍රී නාමය, පවන, නරේන්ද්‍රසිංහ වර්ණනාව, ශෘංගාලංකාරය, ශ්‍රී වික්‍රමාලංකාරය, ඇහැලේපොළ වර්ණනාව දැනට අප අතර ශේෂව ඇති ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථයන් කිහිපයකි. මේ ප්‍රශස්ති කාව්‍යයන්හි කතා නායකයන් ලෙස

- කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා
- පළමුවැනි රාජසිංහ රජතුමා
- සෙනරත් රජතුමා
- II රාජසිංහ රජතුමා
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
- ඇහැලේපොළ අදිකාරම් තුමා

හැඳින්විය හැකිය. මෙම ප්‍රශස්ති වල කතුවරුන් හරිහැටි හඳුනාගෙන නැති වුවත් ඇතැම් ප්‍රශස්ති කාව්‍යයන් -

❖ රාජසිංහ වර්ණනාව - ඌවේ කුඩා මොහොට්ටාල
❖ නරේන්ද්‍රසිංහ වර්ණනාව- රන්මොලක අදිකාරම
❖ ශෘංගාරාලංකාරය - දස්කොන් අදිකාරම
❖ ශ්‍රී වික්‍රමාලංකාරය - පාළුවැවේ ධම්මානන්ද හිමි
❖ ඇහැලේපොළ වර්ණනාව - වැලිගල කිවිඳු
යන කවියන් විසින් කරන ලද්දේ යැයි අනුමාන කරනු ලැබේ.

ප්‍රශස්ති ගායනා සඳහා වැඩිපුරම යොදා ගෙන ඇති භාණ්ඩය වන්නේ උඩැක්කියයි. අත් රබාන ද මේ සඳහා යොදාගෙන ඇත.

**ඇගයීම**

1. ජන ගී වර්ග නම් කරන්න.
2. ජන ගී වල සුවිශේෂී ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
3. සේ ගී යනු මොනවාද?
4. නව ග්‍රහයන් නම් කරන්න.
5. ඔවුන්ගෙන් සිදුවේයැයි සිතන උපද්‍රව දුරු කර ගැනීමට සිදුකරන ශාන්තිකර්මය කුමක්ද? එහිදී කෙරෙන ගායනා හැඳින්වෙන නම කුමක්ද?
6. පන්තේරු කවි වල කියවෙන දෙවියන් කවුද?
7. ප්‍රශස්ති වලට ආවේණික වූ ලක්ෂණ හතරක් ලියන්න.
8. ගැමි ගීයක ලක්ෂණ හතරක් ලියන්න .

- ඉහත ගායනා නිවැරදි නාද මාලාවන් ඔස්සේ ගායනා කරන්න.

**වන්නම්වල පසුබිම:**

උඩරට පහතරට සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනෙහි ම වන්නම් දැකිය හැකිය. වන්නම් යන්නේ අදහස වැනුම නැතහොත් වර්ණනාව යන්නයි. උඩරට සහ සබරගමු යන සම්ප්‍රදායන් දෙකෙහි වන්නම් රචනා වී ඇත්තේ සත්ව, දේව, සිද්ධි හා වස්තු වල ස්වරූපය පදනම් කරගෙන බව වන්නම් වල ස්වරූපය නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වෙයි. පහතරට සින්දු වන්නම් රචනා වී ඇත්තේ සෙත් ශාන්තිය අරමුණු කරගෙනය

**වන්නම් වල පොදු ලක්ෂණ:**

1. මුල් කාලයේදී ගායනය සඳහා රචනා වීම.
2. තාල රූපයකට අනුව නිර්මාණය වී තිබීම.
3. වන්නමෙන් ප්‍රකාශිත දෙයට උචිත නාද මාලාවක් හා ඊට ගැලපෙන තාල රූපයක් යොදා තිබීම.
4. පසුකාලයේදී වන්නම් නර්තනය සඳහා යොදා ගැනීම.
5. නර්තනයේදී අදහස් ප්‍රකාශ කිරීමෙන් තොර වන අතර සම්ප්‍රදායයන්ට අයත් පද කොටස් නර්තනය කිරීම.

**උඩරට වන්නම්**




උඩරට වන්නම් පැතිරී ගිය වකවානුව ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා රජ කළ මහනුවර යුගය ලෙස හැඳින්විය හැක. මෙම වන්නම් කවිකාර මඩුවේ දී රාජකීයයන්ගේ හා වෙනත් ප්‍රභූන්ගේ විනෝදාස්වාදය සඳහා රචනා වූ බව සඳහන්වේ. උඩරට වන්නම් රචනා කළේ කවුද යන්න පිළිබඳ විවිධ මත ඇත.

- 1. J E.සේදරමන් මහතාගේ "නෘත්‍ය රත්නාකරය" නැමැති ග්‍රන්ථයේ සඳහන් පරිදි රම්මොළවක අධිකාරම් තුමන් විසින් වන්නම් ප්‍රබන්ධ කොට ඇති බවත් ඒ සඳහා ඔහුට රජතුමා විසින් නින්දගම් (ගම්වර) ලබා දුන් බවත් සඳහන් වේ.
-
- 2. දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගත් ගණිතාලංකාර නම් බමුණු පඬිවරයා විසින් වන්නම් රචනා වූ බව තවත් මතයකි.
-
- 3. මෙසේ ගෙන්නා ගත් බමුණු පඬිවරයා විසින් රචිත "නෙර්ත මාලය" නමැති කෘතිය ඇසුරු කොට ගෙන මල්වතු විහාරවාසී හිමිනමක් විසින් වන්නම් රචනා කරන ලද බව තවත් මතයකි.

උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රචලිත වන්නම් සංඛ්‍යාව 18කි. එසේ වුවත් ඊට අමතරව නිර්මාණය වූ වන්නම් ලෙස මරගන වන්නම, සමනල වන්නම, මහබෝ වන්නම හා හංස වන්නම සඳහන් කළ හැකිය.

උඩරට වන්නමක ආකෘති වන්නමට අදාල තිත් රූපය මත පිහිටා

- බෙර පදය
- තානම
- කවිය
- මාත්‍රය
- කස්තිරම
- සීරුමාරුව
- අඩව්ව යන අංගවලින් සමන්විතය.

**පහතරට සින්දු වන්නම්**

සින්දු වන්නම් 32 කි. මෙම සින්දු වන්නම් භක්තිය ප්‍රකාශ කරනු ලබන හෙයින් එය විනෝදාස්වාදයෙන් බැහැරව යොදාගත් නර්තනාංගයක් ලෙස සඳහන් කළ හැකිය. සින්දු වන්නම් රචනා කළේ කවුද යන්න පිළිබඳවද විවිධ මත ඇත.

1. අන්ධ බ්‍රාහ්මණයෙකු තමන්ට පෙනීම ලබාදෙන ලෙස ඉල්ලා උපුල්වන් දෙවියන්ට පූජෝපහාර ලෙස සින්දු වන්නම් පෙළ රචනා කළ බව සී ද එස් කුලතිලක මහතා ඔහුගේ "දහඅට වන්නම්" නමැති කෘතියේ සඳහන් කර ඇත.
2. තවත් මතයක් නම් අන්ධ පුද්ගලයෙකු තමාට පෙනීම ලබාදෙන ලෙස ඉල්ලා කවි පන්තියක් රචනා කර දෙන ලෙස " බරණ ගණිතයා" නැමැති කාව්‍ය රචකයා ගෙන් ඉල්ලීමක් කරන ලද බවත් ඒ අනුව බරණ ගණිතයා විසින් සින්දු වන්නම් රචනා කරන ලද බවත් සඳහන් වේ. එම කවි උපුල්වන් දෙවියන් ඉදිරියේ ගායනා කිරීමෙන් ඇස් පෙනීම ඇති වූ බව කියයි.




**සින්දු වන්නමෙහි ආවේණික ලක්ෂණ:**

මෙම සින්දු වන්නම් 32 දම්වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධ වී තිබීම විශේෂ ලක්ෂණයකි. එක් වන්නමක් අවසන් වන පදයෙන් හෝ අක්ෂරයෙන් අනිත් වන්නම ආරම්භ වීම සිදුවේ. සෑම සින්දු වන්නමක් සඳහාම නියමිත වූ තාලයක් හා විරිතක් ඇත. එයින් සින්දු වන්නම හැඳින්වීම ද සිදුවේ.

සෑම වන්නමකටම නියමිත තාලයක් හා වෘත්තයක් ඇත. පසු කාලයේ දී එම සින්දු වන්නම් වලට ගැලපෙන පරිදි බෙර පදය තානම කවිය හා සුරල ( ඉරට්ටිය) සම්බන්ධ කොට නැටීමට ද යොදා ගෙන ඇත. මුල්කාලයේදී මේවාට තිත් ක්‍රමයක් භාවිත නොකළද පසුකාලයේදී තාල හා තිත් ලක්ෂණ සම්බන්ධ කොට ගෙන ඇති බව පෙනේ

උඩරට වන්නමෙහි වන්නම අවසානයෙහි කස්තිරම, සීරුමාරුව, අඩව්ව ලෙස පද කොටස් තුනක් තිබුණ ද පහත රට වන්නම් හි වන්නම අවසානයේ ඇත්තේ එක් පද කොටසකි. ඒ ඉරට්ටිය යි.

**සබරගමු වන්නම්**




සබරගමු වන්නම් උඩරට වන්නම් මෙන්ම විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී ඇති බව වැඩි දෙනාගේ මතය යි. මෙම වන්නම් අතරින් ඇතැම් ඒවා වාද ගී ස්වරූපයක් ගන්නා බව සඳහන් වේ. වාද ගී ගැයීම ද විනෝදාස්වාදය සඳහා ම කෙරෙන්නක් බව සඳහන් කළ යුතුය. ප්‍රභූන්ගේ නිවෙස්වල හා වලව්වල මෙම වන්නම් ගායනය හා නර්තනය කළ බව සඳහන් වේ. මෙම වන්නම් රචනා කිරීම කවුරුන් විසින් කරන ලද්දක් දැයි නිශ්චිතව කිව නොහැකිය. අමිශ්‍ර සබරගමු වන්නම් සබරගමු මහ සමන් දේවාලය මුල් කොටගෙන ඇති වූ බව මිනිසුන්ගේ විශ්වාසයයි.

සබරගමු වන්නම් හි ආකෘතිය බෙර පදය, තානම, කවිය, කලාසම. අඩව්ව යනුවෙන් කොටස් පහකින් යුක්තය.

සබරගමු වන්නම් වල භාෂාව ඉතාමත් සරලය. වන්නම් කිහිපයක් හැරුණු විට ඉන් බොහොමයක්ම ගැමි සමාජයේ එදිනෙදා ව්‍යවහාරයෙහි යෙදෙන බස් වහරට සමානය.

උඩරට වන්නම් වල හා පහත රට වන්නම් වල යෙදෙන කාව්‍යාලංකාර අනුප්‍රාස ව්‍යංගාර්ථ ධ්වනිතාර්ථ හෝ උපමා උපමේය වැනි ලක්ෂණ සබරගමු වන්නම්වල දුර්ලභය. නිදහස් ප්‍රකාශනයට මුල්තැන දී කාව්‍ය රචනා කර තිබීම සබරගමු වන්නම් වල සුවිශේෂ ලක්ෂණයකි.( "වන්නම් ගීත සාහිත්‍ය විචාරය" - ඥානසිරි පීරිස්).

පැරණිම තොරතුරු අනුව සබරගමු වන්නම් 36 ක් ව තිබූ බවත් වර්තමානයේ වන්නම් විසිඑකක් භාවිතයේ පවතින බවත් දැකිය හැක.

ඇගයීම :

1. එක් එක් සම්ප්‍රදායන්හි වන්නම්වල ආකෘතියෙහි ඇති කොටස් වෙන වෙනම දක්වන්න.
2. එක් එක් සම්ප්‍රදායන්ට අයත් වන්නම් වලට ආවේණික වූ සුවිශේෂීතා දෙක බැගින් ලියන්න.
3. වන්නම් වල ආරම්භය පිලිබඳ විස්තරයක් කරන්න

## තාල පුහුණුව



තාල් තැබීම සඳහා යොදාගනු ලබන්නේ තාලම්පට යි

### තනි තිත

- තනි තිතේ තාල රූප තුන කි
    1. මාත්‍රා 2 තාලය (සුලු තනි තිත)
    2. මාත්‍රා 3 තාලය (මැදුම් තනි තිත)
    3. මාත්‍රා 4 තාලය (මහ තනි තිත)

එක් තාල ආවර්තයක් තුළදී එක් වරක් පමණක් තිත වාදනය කරනු ලබන බැවින් මේවා තනි තිතේ තාල රූප ලෙස හැඳින්වේ.

1. මාත්‍රා 2 තාල රූපය (සුලු තනි තිත)

(1 2/1 2)

පහත දක්වා ඇති බෙර පද හා කවි මාත්‍රා 2 තාලය අනුව අතින් තාල තබා කියන්න.

- දොම් /කිත/ කිත /දොම්
- කුඳ /ගත /ගත/ දොම්

එක /පඳු /රෙන් /ලී - /සය/ක් ක/පා-/ගෙන
එක උස සදෙනෙක් තෝරා ගෙන
ගුරුන් අතට දී ලී බෙදවා ගෙන
අපිත් කෙළිමු ලී දෙපිළ සෑදී ගෙන

2. මාත්‍රා 3 තාල රූපය (මැදුම් තනි තිත)

1 2 3/ 1 2 3

මෙම බෙර පද මාත්‍රා 3 තාල රූපය අනුව තල් තබමින් කියන්න.

ජිං - ග / ත ගො ගො

ගුං - ද /දෙ ග ත /ග දි ග/ත ගු ද

මෙම කවිය මාත්‍රා තුන තාලයට අනුව තාල් තබමින් ගයන්න.

ගා - න/තෙල් ස/ඳු න් ව/ර ල ස/
ඹ ම රි/ කො ට - /- - - /- - -
මූන පුරා තෙල් ගාගෙන යන කල ට
මාන බලති මිණිවන් පන් දකිනකොට ට
නෑනෙ නුඹත් එනවද පන් නෙලන්නට ට

3. මාත්‍රා 4 තාල රූපය ( මහ තනි තිත )
1 2 3 4 / 1 2 3 4
මෙම බෙර පද මාත්‍රා 4 තාලයට තාල් තබමින් කියන්න.

- දොම්කිට /කිටදොම්
- දෙගත්ග /තකුදොම්

මෙම කවිය මාත්‍රා 4 තාලයට තාල් තබමින් කියන්න.

+ පළමුව/ බුද්ධං- /සරණේ- /නම ක
දෙවනුව ධම්මං සරණේ නම කර
තෙවනුව සංසං සරණේ නම කර
පතුරු නටන්නට සබයෙන් අවසර

**දෙතිතේ තාල රූප**

එක් තාල ආවර්තයක් තුළදී තිත් වර්ග දෙකක් වාදනය වන හෙයින් මෙම තාල රූප දෙතිතේ තාල රූප ලෙස හැඳින්වේ. දෙතිතේ තාල රූප ද ප්‍රභේද තුනකින් යුක්තය.

1. මාත්‍රා 2+3 තාල රූපය (සුළු මැදුම් දෙතිත)
2. මාත්‍රා 2+4 තාල රූපය (සුලු මහ දෙතිත)
3. මාත්‍රා 3+4 තාල රූපය (මැදුම් මහ දෙතිත)

(1) මාත්‍රා 2+3 තාල රූපය (සුළු මැදුම් දෙතිත)
1 2 + 1 2 3 / 1 2 + 1 2 3
මෙම බෙර පදය තාල් තබමින් කියන්න.

- දොං /ජිං ත/ ග ත/ දොං ත

පහතින් ඇති ගායනය මාත්‍රා 2+3 තාලයට තාල් තබමින් ගායනය කරන්න.

සත් /වෙත් ම/හත්/අදර /ලත්/ යුත් සි/දත්/ කුමරු /ගත් /සිත්තො/සත් /පැවිදි /අං/ගා-- /
/- - /- - - /
අණ කරන ඡන්නයෙන කන්තකය අසු ගෙනෙන ගෙන යෙදුන අසුගෙ පිට නැංගා

(2) මාත්‍රා 2+4 තාලය ( සුළු මහ දෙතිත)
1 2 /1 2 3 4
මෙම බෙර පදය මාත්‍රා 2+ 4 තාලය අනුව තාල් තබා කියන්න.

- දොං /දොං ජිං/ ජිං/ ගජි / ගත

පහත කවිය මාත්‍රා 2 + 4 තාල රූපය අනුව තාල් තබමින් කියන්න.

සුරිඳුන් පෙර සිටන් බලයුත් සැව නිඳුන්
සහ ගොස් කල යුදෙන් අසුරන් ජය නොලදින්

(3) මාත්‍රා 3+4 තාලය ( මැදුම් මහ දෙතිත )
1 2 3 / 1 2 3 4

මෙම බෙර පදය මාත්‍රා 3+4 තාලයට තාල් තබා කියන්න.

- දොං කු ජිං ජිං තකට දොං ත ක

බෝ කොල අන්දම් පෙනය නගා යේ
නා කොළ අන්දම් පෙන හකුලා යේ
ලෝ තුළ රන්දම් සිරිනි දිගා යේ
මේ කුල සතරක් පෙරසිට ආ යේ

තාල රූපයක් තුළ ඇත්තේ එක් ‘‘ජාති’’ ලක්ෂණයක් පමණක් නම් එය තනි තිතේ තාල රූපයකි. ‘‘ජාති’’ ලක්ෂණ දෙකක් එක් වූ විට දෙතිතේ තාල රූපයක් නිර්මාණය වේ. එසේනම් තුන් තිතේ තාල රූපයක් ගොඩනැගෙන්නේ ‘‘ජාති’’ ලක්ෂණ තුනක් සංකලනය වීමෙනි.

**තුන් තිතේ තාල රූප**

තුන් තිතේ තාල රූප ප්‍රභේද හතක් ඇත. එයින් දෙකක් අපි ඉගෙන ගනිමු.

(1) මාත්‍රා 2 +2 + 3 තාල රූපය
(2) මාත්‍රා 2 +2 + 4 තාල රූපය

(1) මාත්‍රා 2 + 2 + 3 තාල රූපය (දෙ සුලු මැදුම් තුන් තිත)
1 2 / 1 2 / 1 2 3/ 1 2 /1 2 /1 2 3

මෙම තාල රූපයෙහි මාත්‍රා දෙකේ ගොඩවල් දෙකක් සහ මාත්‍රා තුනේ ගොඩවල් එකක් සංයෝග වී ඇත.
දෙ සුලු මැදුම් තුන් තිත වනුයේ එහෙයිනි.

මෙම බෙරපදය මාත්‍රා 2 +2 + 3 තාලයට තාල් තබා කියන්න.

- දොං තකු /දොං තකු /දොං ජිං - /
- ගත් - /තත් - / ජිං තරිකිට/

පහත සඳහන් කවිය මාත්‍රා 2 + 2+ 3 තාලයට තාල් තබමින් ගායනා කිරීමට උත්සාහ කරන්න.
- - / - - / සතර /සිව් / වර / බලැති දිඝ/ තර / සුරිඳු/නේ - /කදි /රා - - /
- - / - - /කතර/ගම /පුර /සුරිඳු /වා - /හන
කරති /රණ /මොණ/රා - - /

(2) මාත්‍රා 2 + 2 + 4 තාල රූපය (දෙසුලු මහ තුන් තිත)

මෙම තාල රූපය මාත්‍රා 2 ගොඩවල් දෙකක් සහ මාත්‍රා 4 ගොඩවල් එකකින් සැදී ඇත. එහෙයින් දෙ සුළු මහ තුන් තිත වෙයි. මෙම තිත ට හොඳම උදාහරණයක් ලෙස කුදන්ත ගත දොම් වට්ටම දැක්විය හැක.

1 2 /1 2 /1 2 3 4
+ + / + + / කු දා න් ත /ග ත/ දොං - /

මෙම තාල රූපය අනුව කුදාන්ත ගත දොම් වට්ටමේ වට්ටම් පිරීමේ පදය තාල් තබා කියමු.

- කුදාන්ත ගත කුඳ දොම්කිට
- තරිකිට කුංදත් තා

+ + / + + / කුදාන්ත/ ගත / කුඳ / දොම්කිට
තරිකිට /කුංදත් /තා - - - /..

# මනිපුරි නර්තන සම්ප්‍රදාය

භාරතීය නර්තන සම්ප්‍රදායන් අතරේ සුවිශේෂී නර්තන සම්ප්‍රදායකි, මනිපුරි නර්තන සම්ප්‍රදාය. මෙම නර්තන සම්ප්‍රදාය **ඊසානදිග භාරතයෙහි බ්‍රහ්මපුත්‍ර නදියත් ඇසෑමයත් අතර පිහිටි කඳු වැටි සහ සුන්දර මීටියාවත් වලින් ගහන වූ මනිපුරි දේශයෙහි උපත ලැබූවකි.**

මෙහි වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන්නේ ගොවිතැනයි. මොවුහු ආගමික භක්තියට සහ දේව විශ්වාසයට ප්‍රමුඛතාවයක් දී ඇත දී ඇත. ඒ නිසාම ඔවුන්ගේ සංස්කෘතිය සමග මනිපුරි නර්තනය එකට බැඳී ඇත්තේ දේව විශ්වාසයන් පදනම් කොටගෙනය.

ගහකොළ මලින් හා ඵලයෙන් පිරී ගිය වසන්ත සමය ඔවුනට ප්‍රීතිමත් කාලවකවානුවකි. පරිසරයෙහි ඇති සුන්දරත්වයත් කෙත්වතුවලින් නෙලාගත් අස්වැන්නෙන් අටුකොටු පිරී යාම හේතු කොටගෙන මෙම කාලවකවානුව ඔවුන්ගේ උත්සව සමය බවට පත්වෙයි.

දෙවියන් වෙනුවෙන් මහත් භක්තියෙන් යුතුව ප්‍රීති උත්සවයන්හි යෙදෙන මෙම කාලය තුළ දක්නට ලැබෙන ප්‍රධානතම වාර්ෂික උත්සවය වන්නේ මාසයක් පුරා පවත්වනු ලබන **හේලි උත්සවයයි.** ඔවුන් දෙවියන් වෙත දක්වන භක්තිය ඔවුන්හට සෞභාග්‍ය වාසනාව හා සතුට ගෙන එන බව ඔවුන්ගේ විශ්වාසයය

මනිපුරි දේශය ද මනිපුරි නර්තනය ද දෙවියන් වෙතින් ලත් දායාදයක් ලෙසින් මනිපුරි වාසීහු පිළිගනිති. මනිපුරි නර්තනය තේමා කොටගත් කතා වස්තූන් සේම මනිපුරි රාස්ලීලා නර්තනයෙහි ප්‍රභවය ගැන කියවෙන පුරාවෘත්ත ද ඉතාමත් රසවත්ය.

## මනිපුරි නර්තනයෙහි ආරම්භය

15 වන සියවසෙහි මනිපුරි ප්‍රදේශය පාලනය කළේ රාජාකර්තා නම් වූ රජ කෙනෙකි. වෛෂ්ණව හෙවත් විෂ්ණු භක්තිකයෙකු වූ මොහු තම රට ඉතාමත් ධාර්මිෂ්ඨ අයුරින් පාලනය කළේය. මේ අතර බලකාමයෙන් මත්ව සිටි නාග ගෝත්‍රිකයින් විසින් මනිපුරි ප්‍රදේශය යටත් කර ගන්නා ලදී. රාජාකර්තා රජු ඇසෑමයේ රජු වෙතට ගොස් ඔහුගෙන් ආරක්ෂාව පතමින් එහි ජීවත් විය. ඉතා කනස්සල්ලෙන් පසු වූ රාජාකර්තා රජු විෂ්ණු දෙවියන් ගෙන්, මහත් භක්තියෙන් යුක්තව තම රාජ්‍යය යළිත් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. තම රාජ්‍යය යළිත් ලබාගත හැකි වුවහොත් දේවස්ථානය කරවා දෙවියන් වෙනුවෙන් පුද පූජා පවත්වන බවට රජතුමා භාරයක් ද විය.

දිනක් රාජාකර්තා රජතුමාට අපූරු සිහිනයක් පෙනිණි. ඒ සිහිනය නම් විෂ්ණු දෙවියන් පැමිණ සඳුන් කොටයක් පෙන්වා එයින් ක්‍රිෂ්ණ ගේ පිළිරුවක් නිර්මාණය කරන ලෙස ඉල්ලා සිටීමයි. මෙය සිතට ගත් රජතුමා එකී සඳුන් කොටයෙන් දේව රුව නිර්මාණය කොට, මහත් භක්තියෙන් යුතුව ක්‍රිෂ්ණ ගේ ගුණ වර්ණනා කළේය. මේ වන විට භාවනානුයෝගීව සිටි ක්‍රිෂ්ණ, රජතුමා කෙරෙහි පැහැදී ඔහු ඉදිරියේ පෙනී සිට තමාගේ මකුට පළඳනාව ඔහු වෙත ප්‍රදානය කළේය.

අනතුරුව රාජකර්තා රජතුමාට තමන්ගේ රාජධානිය වූ මනිපුරි දේශයෙහි නැවත රාජ්‍යත්වයට පත්වීමට හැකි විය. දෙවියන් වෙනුවෙන් තමන් විසින් වූ පොරොන්දුව ඉටු ඉටුකරනු වස් රජතුමා, මහා දේව මන්දිරයක් තනවා ක්‍රිෂ්ණ පිළිරුව මහත් පෙරහැරෙන් වඩම්මවා ගෙන ගොස් එහි තැන්පත් කර මහත් උත්සව පැවැත්වීය.

දෙවියන්ගේ ජීවන පුවත් ඇතුළත්කොට රාස්ලීලා නම් නර්තනය බිහිවූයේ මෙම සිදු වීමෙන් පසුය. මෙම රාස්ලීලා නර්තනය සඳහා යොදාගනු ලබන රංගවස්ත්‍රාභරණ පවා දෙවියන්ගේ උපදෙස් මත නිර්මාණය කරන ලද බව මනිපුරි වාසීහු විශ්වාස කරති.

**මනිපුරි නර්තනයේ උන්නතිය සඳහා සේවය කළ රජවරුන් හා කලාකරුවන්:**

1. මහාරාජ් භාග්‍ය චන්ද්‍ර ජායි සිං( 1759 – 1798)
2. මහාරාජ් ගම්භීර් සිං ( 1825 – 1824 )
3. මහාරාජ් චන්ද්‍ර දා කීර්ති සිං ( 1849 – 1886 )

වර්තමාන මනිපුරි නර්තනයට අද්විතීය සේවාවක් කළ ශ්‍රේෂ්ඨ කලාකරුවා ලෙස සැලකෙන්නේ **රබින්ද්‍රනාත් තාගෝර් තුමා** ය. එතුමා 1919දී මනිපුරි දේශයේ කරන ලද සංචාරයකින් පසුව එම ප්‍රදේශයට පමණක් සීමා වී තිබුණු ඒ සුන්දර නර්තන ක්‍රමය දැක එය සමස්ත ඉන්දියාව පුරා පමණක් නොව මුළු මහත් ලෝකය පුරාම ප්‍රචලිත කිරීමට කටයුතු කළේය.

හින්දු ආගමික දේව පුවත් තේමා කොටගෙන ගොඩනැගී ඇති මෙම නර්තනයෙහි වඩාත්ම ප්‍රචලිත තේමාව ලෙස යොදාගෙන ඇත්තේ රධාක්‍රිෂ්ණා ප්‍රේම පුරාවෘත්තයයි.




ස්ත්‍රී පුරුෂ දෙපිරිසම සහභාගී වන මෙම නර්තන සම්ප්‍රදායේ දක්නට ලැබෙන වඩාත්ම වැදගත් නර්තනාංගය ලෙස රාස් නර්තනය නැතහොත් රාස්ලීලා නම් වූ නර්තනාංගය හැඳින්වේ හැකියි. ක්‍රිශ්ණා සහ රාධා බෘන්දා වනයේ දී එකිනෙකා හා කෙලිදෙලෙන් පසුවන අවස්ථා ඔවුන්ගේ ප්‍රේමය සහ ගෝපිකාවන් අතර ගතකරන සුන්දර අවස්ථා මෙම නර්තනාංගයන් ගෙන් නිරූපණය වෙයි. ඉතාමත් ශෘංගාරාත්මක නර්තන විශේෂයකි.

**වාද්‍ය භාණ්ඩ**




- ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ **පුංග්** බෙරයයි. මෙය මනිපුරි මෘදන්ගය, මනිපුරි කෝල් බෙරය වැනි නම්වලින් ද හඳුන්වනු ලබයි. මෙම පුංග් බෙරය ලීයෙන් තනා ඇති අතර මැදින් මහත්ව දෙකෙළවර ක්‍රමිකව සිහින්ව සකසා ඇත. ඉතා ළඟින් ළඟ යොදා ඇති වරපට වලින් ශක්තිමත් කෙරේ. එක් ඇසක් අඟල් 6 ක විශ්කම්භයකින් යුක්ත වන අතර අනෙක් ඇස අඟල් 4 ක විශ්කම්භයකින් යුක්තය. දෙපසෙහිම බදාම යොදා තිබේ.මෙය වාදනය කිරීමේදී බෙරයේ කඳ සුදු රෙදි කඩකින් ආවරණය කිරීම සිරිතයි.




- **පෙනා** හෙවත් **පෙනකොම්බා** යනුවෙන් හැඳින්වෙන අලුවකින් වාදනය කරන ඒක තන්ත්‍රී වීණාව සහ තාලම්පට ද **භාෂි** නමින් හඳුන්වන බටනළාව ද මනිපුරි නර්තනය සඳහා උපයෝගී කරගනු ලබන තවත් වාද්‍ය භාණ්ඩ වේ. වර්තමානයේ දී සාරංගිය සහ හාර්මෝනියම් වැනි සංගීත භාණ්ඩ ද යොදා ගැනේ.

**සංගීතය :**

උත්තර භාරතීය රාගධාරී සංගීත සම්ප්‍රදාය පදනම් කොට ගෙන සැකසුණු එසේම මනිපුරි දේශයෙහි අනන්‍යතාවය දැක්වෙන ලක්ෂණයන්ගෙන් යුතුව මනිපුරි සංගීතය නිමවී ඇත. මෙකී නර්තනයේදී මනිපුරි සංගීතයත් සමග ශ්ලෝක සහ දෙවියන් වෙනුවෙන් ගැයෙන භක්ති ගීත ගායනය කරනු ලබයි.

**රංග වස්ත්‍රාභරණ:**

ඉතාමත් විචිත්‍ර ස්වභාවයකින් යුක්තය නර්තනයෙහි අන්තර්ගත සියුම් චලන දැක්වීමට යෝග්‍ය වන ආකාරයෙන් සැකසී ඇත. එසේම ඍංගාරාත්මක වූත් ලාස්‍ය වූත් රංග විලාසයන් ඉස්මතු වී පෙනෙන ආකාරයෙන් මෙකී රංගවස්ත්‍රාභරණ සකස් කොට ඇත.




**කාන්තා රංග වස්ත්‍රාභරණ (රාධා සහ ගෝපිකා වන්ගේ):**

**කුමින් :** ඉනේ සිට වළලලුකර තෙක් වැසෙන සේ සකස් කළ බැරලයක ආකෘතිය ඇති සාය මේ නමින් හැඳින්වේ. මෙය රන්රිදී නූලෙන් අලංකාර මෝස්තර සහිතව ගෙත්තම් කර ඇති අතර තැනින් තැන පළිඟු කැට හා තුනී කණ්නාඩි කැබලි අල්ලා දිස්නය හා චමත්කාරය ලබා දී ඇත.

**පොෂ්වාන් : කුමින්** ඇඳුමට උඩින් ඒ මත විනිවිද පෙනෙන සුදු පැහැති දුහුල් රෙද්දෙන් මසන ලද කෙටි සාය මේ නමින් හැඳින්වේ. එය ඉතා අලංකාර රැළි සහිතව දිස් වූ චමත්කාරය වැඩි කරන රංග වස්ත්‍ර කොටසකි.

**ක්වoගොයි :** ඉනට පළඳින පටිය

**රිෂම්පුරිට් :** උඩුකය සඳහා අඳිනු ලබන අත් කොට විල්ලුද හැට්ටය රිෂම්පුරිට් නමින් හැඳින්වේ. මෙය කළු රතු හෝ කොළ පැහැති තද වර්ණයන්ගෙන් සැකසී ඇත එහි අතර ඉහ පෙදෙස රන්වන් බෝඩර වලින් අලංකාර කර තිබේ.

**මයිකුම් :** හිසට පලඳන වේලය.

**කොක්තුම්බි :** හිස් පළඳනාව.

**කුදොස් :** දෑතට පලඳින වළලු.

**කුණ්ඩලානි :** කරාබු.

**පිරිමි රංග වස්ත්‍රාභරණ ( ක්‍රිෂ්ණගේ)**

**ධෝතිය :** ගෙත්තමින් අලංකාර කර ඇති යටි කයට අඳිනු ලබන ඇඳුමයි. මෙය තැඹිලි පැහැයෙන් හෝ කහ පැහැයෙන් යුක්ත වේ.

**රිෂම්පුරිට් :** උඩුකයට අඳිනු ලබන කළු පැහැති හැට්ටය

**මකුට පලදනාව( චූරා ) :** ක්‍රිෂ්ණ සඳහා පමණක් වෙන්වූ සුවිශේෂී ආභරණයකි. මොනර පිහාටුවක ආකෘතියකින් සෑදී ඇත.

**කුදොස් :** දෑතට පලඳින වළලු විශේෂයකි.

**මනිපුරි නර්තනාංග :**

**රාස්ලීලා** : - රාධා සහ ක්‍රිෂ්ණාගේ ප්‍රේම වෘත්තාන්තය තේමා කර ගනිමින් නිර්මාණය වී ඇත. විවිධ උත්සව අවස්ථා නියෝජනය කරන රාස්ලීලා වර්ග බොහොමයක් ඇත. වසන්ත රාස්, මහා රාස්, කුන්ජ් රාස්, නෘත්‍ය රාස්, ගොප් රාස්, උලූකාල් රාස්, දිව්‍ය රාස් ආදී වශයෙනි.

**පරෙංග් :** මනිපුරි නර්තනයේ මූලික අභ්‍යාස වන **චාලි** වල සුවිශේෂ පද කොටස් පරෙංග් නමින් හැඳින්වෙන අතර ඒවාද වර්ගීකරණය කර ඇත.

**පුන්ග්චෝලම් :** පුංග් නම් වූ බෙරය කරෙහි ලාගෙන කණ්ඩායමක් විසින් කරන ලද බෙරවාදන නර්තනයකි. මෙය ඉතා සංකීර්ණ බවින් යුක්ත වන අතර විවිධ ආගමික හා සමාජීය අවස්ථාවල දී රඟ දක්වනු ලැබේ.

**කර්තාල් චෝලම් :** විවිධ තාල මත කෙරෙන සාමූහික තාලම් නර්තනයකි.

**සන්කීර්තම් :** ජන ජීවිතයේ සිදුවන උත්සව අවස්ථා ලෙස සැලකෙන කන් විදීම, බත් කැවීම විවාහය ආදී ඒ දී සංකීර්තම් නටනු ලැබේ.

## ඇගයීම

මනිපුරි නර්තන සම්ප්‍රදාය පාඩම ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රශ්න | පිළිතුරු |
|---|---|
| මණිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රභවය ලැබූ ප්‍රදේශය | |
| මනිපුරි නර්තනයේ පුරාවෘත්තය | |
| මනිපුරි නර්තනයේ අභිවෘද්ධියට දායක වූවෝ | |
| මනිපුරි නර්තනය ඉන්දියාව පුරා ප්‍රචලිත කිරීමට මුල් වූ තැනැත්තා | |
| මනිපුරි නර්තනයෙන් විදහා දැක්වෙන ප්‍රධාන චරිත දෙක | |
| මනිපුරි<br>නර්තන අංග | |
| රාධාගේ සහ ගෝපිකාවන්ගේ<br>රංග වස්ත්‍රාභරණ | |

## රසභාව හඳුනාගනිමු

රසය යනු හිතේ ඇතිවන හැඟීමකි. අප විසින් පංචේන්ද්‍රියන් මගින් ග්‍රහණය කරගනු ලබන ප්‍රබෝධකයක් කරණකොටගෙන ඊට ප්‍රතිචාර වශයෙන් සිතෙහි උපදින සියුම් හැඟීමක් නැතහොත් හැඟීම් සමුදායක් අපි රසයක් ලෙස හඳුන්වමු. ස්වභාව ධර්මයේ පවතින දේවල් සේම මිනිසා විසින් නිර්මාණය කළ නැටුම්, නාට්‍ය, චිත්‍රපට, ටෙලි නාට්‍ය, සංගීතය, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ නවකතා, කෙටිකතා, කාව්‍ය නිර්මාණ යනාදී දේ ඇසුරු කිරීමෙන් ද රස විඳීමක් අත්පත් කරගත හැකිය.

### නව නළු රසය

භාරතයෙහි පෙර විසූ භරතමුනි නම් වූ පඬිවරයා විසින් රචනා කරන ලදැයි සැලකෙන **නාට්‍ය ශාස්ත්‍රය** නමැති ග්‍රන්ථයේ රසයත් රස උපදින ආකාරයත් පිළිබඳව විස්තර කර ඇත. ඔහු පෙන්වා දෙන පරිදි රසයක් උපදින්නේ භාවයක් මුල්කරගෙනය. භාවයක් යනු පුද්ගලයෙකුගේ සිතෙහි නොවෙනස්ව නැතහොත් ස්ථාවරව පවතින්නාවූ හැඟීම් සමුදායකි. එනම් ස්ථායි භාවයන්ය. මේවා මිනිස් සිතෙහි නිදන්ගතව පවතින බව භරත මුනිවරයා පෙන්වා දෙයි.

භරතමුනිවරයාගේ පැහැදිලි කිරීම අනුව මිනිස් සිතෙහි භාවයන් අටක් පවතී. ඒවා නම් **රති, හාස, ශෝක, ක්‍රෝධ, උත්සහ, භය, ජුගුප්සා, විස්ම** යන අටයි.

භරතමුනිවරයාගෙන් පසුව සිටි වෙනත් පඬිවරු අතරින් **ශංකුෂ** නැමැති පඬිවරයා භරතමුණි පඬිවරයා ඉදිරිපත් කර තිබූ රස අටට තවත් රසයක් එක්කරමින් එය නවයක් බවට පත් කළේය. අලුතෙන් එක් කළ රසය **ශාන්ත** නම් වූ රසය යි. එහි භාවය වන්නේ භක්තියයි.

**නවනළු රසය භාවයන් සහිතව**

| **භාවය** | **රසය** |
|---|---|
| **1.** රතිය | ශෘංගාර |
| **2.** හාස | හාස්‍ය |
| **3.** ශෝක | කරුණා |
| **4.** ක්රෝධ | රෞද්‍ර |
| **5.** උත්සහ | වීර |
| **6.** භය | භයානක |
| **7.** ජුගුප්සා | බීභත්ස්‍ය |
| **8.** විස්ම | අද්භූත |
| **9.** භක්තිය | ශාන්ත (ශම) |

**රසයක් යනු අප දකින දැනෙන යනාදී වශයෙන් වූ අප හා සම්බන්ධ වූ ක්‍රියාවලින් හේතු කොටගෙන සිතට සංවේදී වන කිසියම් මානසික තත්ත්වයක් ලෙස හැඳින්විය හැකියි.**

අප ජීවත් වන කාලසීමාව තුළදී නොදැනුවත්වම වුවද භාවයන් සහ රසයන් අප සිත් තුළ ජනිත වේ. එහෙත් කලාකරුවෙක් නිර්මාණයක් කිරීමේ දී භාවයන් උපද්දවා මෙම රසයන් මිනිස් සිත් සතන් තුළ ජනිත කරවමින් නව මානයන් වෙත ප්‍රේක්ෂකයා හෝ පාඨකයා ගෙන යනු ලබයි. ං

රසවිඳීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. එක් එක් පුද්ගලයා සතු උගත්කම්, වයස් මට්ටම්. අත්දැකීම් ආදී වශයෙන් වූ කරුණු ඒ කෙරෙහි බලපායි. මේ හේතුවෙන් පුද්ගලයෙකු තුළ යම්කිසි කෘතියක් රස විඳීමේදී ඔහු සතු දැනුමේ පුළුල් බව හෝ පටු බව මත ඔහුගේ රස විඳීම් ශක්තිය තීරණය වෙයි.

වර්තමානයේ ඉහතින් සඳහන් කළ නව නළු රසය ට අමතරව තවත් රසයන් එකතු වී ඇත. 'උපහාස රසය" ඉන් එකකි. මෙය හාස්‍ය රසයට වඩා වෙනස් එකකි. එසේම රටට දැයට ඇති ආදරය ජාතිවාත්සල්‍යය වැනි රසයන් ඉහත කී නව නළු රසය තුළ දක්නට නැත.



රසයක් මතු වන්නේ කිසියම් භාවයක් මුල්කරගෙන බව අපි දැන් දනිමු. ශාන්තිකර්මයක දී විවිධ චරිතයන් නිරූපනය කරන ශිල්පීන් විසින් කරනු ලබන්නේ ද භාව ප්‍රකාශනයකි. එකී භාවයන් නරඹන ප්‍රේක්ෂකයන් සතුටට පත්වේ. එමගින් ඔවුන්ගේ සිත් තුළ රසයක් උපදී. අපගේ දේශීය නර්තන සම්ප්‍රදායන් හැම එකකම වාගේ රසභාවයන් දක්නට තිබුණ ද පහතරට නර්තන සම්ප්‍රදායේ එය බහුලව දැකිය හැක. ඊට හොඳම උදාහරණ ලෙස සන්නි යකුම හෙවත් දහඅට සන්නිය ශාන්තිකර්මය දැක්විය හැක.

රටයකුම ශාන්තිකර්මයේ එන කපුයක්කාරිය, නානුමුරය වැනි නාට්‍යමය අවස්ථා දෙවොල් මඩුවේ එන අඹ විදමන දෙවොල් ගොඩ බැසීම ඇස් බන්ධනය නිබන්ධනය මරා ඉපැද්දවීම වැනි අවස්ථාවන් මේ සඳහා ඉදිරිපත් කළ හැකි තවත් සාධක වේ.

උඩරට කොහොඹා කංකාරියේ එන ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම වැනි යක්කම් ද ගුරුගේ මාලාව වැනි අංග නාට්‍යමය පෙළපාලි ලෙස හැඳින්විය හැකිය. රංගනය හා සංවාදය තුලින් හාස්‍ය රසය උත්පාදනය කිරීම මෙහි විශේෂ ලක්ෂණයකි.

සබරගමු නර්තන සම්ප්රදායේ එන අඹ විදමන, රාමා මැරීම, අසුර යක්කම ආදියේ දී ද විවිධ රස උත්පාදනය සිදුවන අවස්ථා ඇත.










### ඇගයීම

පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. රසය යනු කවරක්ද? හඳුන්වන්න.
2. නාට්‍ය ශාස්ත්‍රය නම් වූ ග්‍රන්ථය කවුරුන් විසින් රචනා කරන ලද්දක් ද?
3. නාට්‍ය ශාස්ත්‍රය නම් වූ ග්‍රන්ථයේ රසභාව කීයක් සඳහන් වේද? ඒ මොනවාද?
4. ශංකුශ යනු කවරෙක්ද?
5. ඔහු විසින් එක් කරන ලද රසය කුමක්ද?
6. නවනලු රසය ට අමතරව වර්තමානයේ එක්වී ඇති රසයන් මොනවාද?
7. දේශීය නර්තන සම්ප්‍රදායන් තුළ නව නළු රසය ඉස්මතු වන අවස්ථා දක්වන්න?

# නර්තන කලාවේ නූතන ප්‍රවණතා


යුගයෙන් යුගයට පරපුරෙන් පරපුරට දායාද කරමින් පැවතගෙන ආ නර්තන කලාව සංස්කෘතිය හා එකිනෙක මුසු වෙමින් අද දක්වාම නොනැසී පවතී. අපේ ඉතිහාසය දෙස බලන විට ගතවූ සෑම යුගයකම නර්තන කලාව ඉහළ මට්ටමක පැවතුණු බව එක් එක් මූලාශ්‍ර අධ්‍යනය කිරීමෙන් පැහැදිලි වේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා නැටුම, සතුට ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ලෙසත් තවත් විටෙක නොපෙනෙන බලවේගයන් ගේ ආශිර්වාදය ලබා ගැනීමට ඉදිරිපත් කළ අංගයක් හැටියටත් යොදා ගනු ලැබීය.

කැලෙන් එළියට ආ මිනිසා ශිෂ්ට සම්පන්න පුද්ගලයෙකු හැටියට ජීවත් වීම පටන්ගත් දා සිට විවිධ අවස්ථාවල නර්තනය යොදා ගත් ආකාරයත් ලක්දිවට බුදු සසුන ලැබීමෙන් පසු හෙළ කලා කෙත අස්වද්දන්නට බුදුසසුනෙහි බලපෑම ඉවහල් වූ ආකාරය ත් නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විමසීමේදී අපට පසක් වේ.

එසේ පැවතගෙන ආ නර්තන කලාවේ නූතන ප්‍රවණතා පිළිබඳව විමසීමේ දී එහි සන්ධිස්ථානයක් ලෙස 1934 වර්ෂය අපට වැදගත් වෙයි. ඒ 1934 වර්ෂයේ රබින්ද්‍රනාත් තාගෝර් තුමාගේ ලංකාගමනයයි.

භාරතීය මුද්‍රා නාට්‍ය කලාව ඇසුරෙන් හෙළ ඌරුවට සැකසුණු ඉගිනළු බිහි වුණේ මේ යුගයේදීය. චිත්‍රසේන, පණීභාරත, ප්‍රේමකුමාර එපිටවල, වජිරා, වසන්ත කුමාර ආදී වශයෙන් වූ කලාකරුවන්ගේ නිර්මාණ දායකත්වය නර්තන කලාවේ ප්‍රබෝධය ට බෙහෙවින් බලපෑවේය.

මේ වන විට පාරම්පරික ගුරුකුල වලට පමණක් සීමාවී තිබූ සාම්ප්‍රදායික නර්තන කලාව පොදු ජනයා අතර ප්‍රචලිත වන්නට විය.



රබින්ද්‍රනාත් තාගෝර් තුමා





චිත්‍රසේන, වජිරා

උසස් යැයි සම්මත කුලවල කාන්තාවෝ පවා නර්තන කලාව හදාරන්නට උනන්දු වූහ. නර්තනය පාසල් විෂය ධාරාවට එක් වීම නර්තන කලාවේ ප්‍රගමනයට තවත් සුවිශේෂී හේතුවක් විය. සිංහල ජනයා අතර පැතිරුණු නර්තන කලාවට විදේශයන්හි පැවති උත්සව සන්දර්ශන ප්‍රදර්ශන සඳහා අවස්ථා සැලසීම ජාතික තත්ත්වයෙන් අන්තර්ජාතික තත්ත්වයට පිවිසීමකි. expo 67 වැනි ප්‍රදර්ශන මෙයට හොඳම උදාහරණයකි. 1952 වර්ෂයේ රජයේ ලලිත කලායතනය බිහිවිය. මෙමගින් ලංකාවේ බොහෝ දෙනෙකුට නර්තන කලාව හැදෑරීමට අවස්ථාව හිමි විය. 1956 වර්ෂයේ සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු කලායතන බිහිවිය. ලංකාව පුරා මෙම කලායතන ස්ථාපිත වීම නර්තන කලාව හදාරණ දරුවන්හට ඊට නව මංපෙත් පහළ වීමක් ලෙස පෙනේ.

රජයේ පාසැල් වල සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයයක් වීම හා සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය ආරම්භ වීම 1972 වර්ෂයේ දී සිදුවිය. චිත්‍ර, නැටුම් සංගීත යන විෂයයන් සියල්ල සෑම සිසු දරුවකුම ඉගෙනගත යුතු යැයි තීරණය වී තිබුණ ද අවසානයේ ඉන් එක් සෞන්දර්ය විෂයක් හෝ සෑම දරුවෙකුට ම ඉගෙනීමේ අවස්ථාව මීන් උදාවිය.

1978 වර්ෂයේ අපොස සාමාන්‍ය පෙළ විභාගය සඳහා ද අපොස උසස් පෙළ විභාගය සඳහා ද නර්තන විෂය විෂයක් වශයෙන් ඇතුළු කිරීම උසස් අධ්‍යාපනය හදාරන සිසුන් හට විශ්වවිද්‍යාල වරම් දක්වා ඉහලට යාමට ලැබුණු අනගි අවස්ථාවකි. ඉන් නර්තන විෂයෙන් උපාධියක් ලබා ගැ නීමේ හැකියාව සිසු දරුවන්ට උදාවිය.

80 දශකයේ ආරම්භ කෙරුණු තරුණ සේවා සභාව හා බෙල්වුඩ් ගම්මානයේ සෞන්දර්ය නිකේතනය වැනි ආයතන නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ආයතන වෙයි.

2005 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපන ආයතනය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් කෙරුණු අතර එය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ලෙස නම් කෙරිණි. මෙම විශ්වවිද්‍යාලයෙන් බිහිවූ සෞන්දර්යවේදීන්ට ආචාර්යවරුන්ට මහාචාර්යවරුන්ට උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගතවීමට ද අවස්ථාව සැලසුණි.

නර්තන විෂයේ ප්‍රවර්ධනයට තුඩු දූන් තවත් හේතු සාධකයකි, විවිධ ආයතන බිහි වීම හා විවිධ නර්තන කණ්ඩායම් බිහි වීම. එනම්,

- ත්‍රිවිධ හමුදා නර්තන කණ්ඩායම්
- රාජ්‍ය නර්තන කණ්ඩායම
- පළාත් නර්තන කණ්ඩායම්
- පෞද්ගලික නර්තන කණ්ඩායම්

ජනමාධ්‍යය ත් තාක්ෂණික දියුණුවත් නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ තවත් හේතුවකි. නර්තන විෂය යනු හුදෙක් ප්‍රායෝගික විෂයක්ම නොව ඊට වඩා එහා ගිය විද්‍යාත්මක පසුතලයක් මත සැකසුණු පුළුල් විෂය පථයක් සහිත විෂයක් බව වියතුන් විසින් කරන ලද පර්යේෂණ මගින් පැහැදිලි වෙයි. මෙසේ පර්යේෂණ මගින් විවිධ නර්තන කෘති රචනා වීම ද නර්තන කලාවේ උන්නතිය උදෙසා බෙහෙවින් බලපා ඇත.

**ඇගයීම**

1. නර්තන කලාවේ නව ප්‍රබෝධය නිසා සිදු වූ ප්‍රවණතා පහක් ලියන්න.
2. 70 දශකයේ අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදුවූ වටිනාකම් පෙළගස්වන්න.
3. ශ්‍රී ලාංකික නර්තන ශිල්පීන් අන්තර්ජාතික තලයට පිවිසීම නර්තන කලාවට බලපෑ අයුරු පිළිබඳ කරුණු දක්වන්න.
4. තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ කරුණු මොනවාද?

කෙටි පිළිතුරු ලියන්න

1) ජන ගායනා වල පොදු ලක්ෂණ දෙකක් ලියන්න.

2) අනාසාතාත්මක ගායනාවන් වර්ග කීපයක් ලියන්න.

3) කෙලි ගී නිර්මාණයට අන්තර්ගත වූයේ කුමක්ද?

4) හටන් කවි ගායනයෙන් පෙන්නුම් කරන ලක්ෂණ තුනක් ලියන්න.

5) මෝල් ගස් කවි කුමන කාර්යයක් කිරීමේ දී යොදා ගනු ලබයි ද?

6) ග්‍රහපන්ති කවි ගායනා කරන්නේ ................................. කර්මයේදී ය.

7) ප්‍රථම ප්‍රශස්ති කාව්‍ය ලෙස සැලකෙන්නේ .......................... සිරිතය. එය රචනා කරන ලද්දේ ශ්‍රී .................................... රජතුමාගේ ගුණ වර්ණනා කිරීම් සඳහා ය.

8) "සිත් ලෙස ලොව සැදි චක්‍ර වලල් ලා" ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න. මෙම කවිය කිනම් නර්තනයක් සඳහා උපයෝගී කර ගනීද?

9) ප්‍රකට ප්‍රශස්ති කාව්‍ය සංග්‍රහයන් තුනක් ලියා දක්වන්න.

10) පන්තේරු නැටුම සඳහා යොදා ගන්නා කවියක් මහ තනි තිතට ප්‍රස්තාර කරන්න.

යා කරන්න

| | |
|---|---|
| 11) රතී භාවයෙන් | ශාන්ත රසය ද උපදී |
| 12) හාස භාවයෙන් | අත්භූත රසය ද උපදී |
| 13) ජුගුප්සා භාවයෙන් | ශෘංගාර රසය ද උපදී |
| 14) විශ්ම භාවයෙන් | හාස්‍ය රසය ද උපදී |
| 15) ශම භාවයෙන් | පිළිකුල් රසය ද උපදී |

කෙටි පිළිතුරු ලියන්න

16) අනුභාවයන් යනු ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාවයි. එයද ආකාර දෙකකි. ඒ ආකාර දෙක සඳහන් කරන්න.

17) ගැමි නැටුම් නිර්මාණයේදී වස්තු විෂය කරගත් ක්‍රම ඇත. එයින් ක්‍රම තුනක් ලියන්න.

18) කෘෂිකාර්මික ජීවන වෘත්තීන් හා බැඳි නැටුම් කීපයක් ලියන්න.

19) විනෝද ක්‍රීඩා ආශ්‍රිත ගැමි නැටුම් ඇත. එයින් තුනක් ලියන්න.

20) ද්‍රවිඩ ගැමි නැටුම් ක්ෂේත්‍ර දෙකක් යටතේ වර්ගීකරණය වී ඇත. ඒ වර්ගීකරණ දෙක සඳහන් කරන්න.

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

21) දේශීය ගැමි නැටුම් වල සුවිශේෂී ලක්ෂණයකි.

1. කාන්තාවන් පමණක් නර්තනය කිරීම.
2. සංකීර්ණ පද කොටස් ඇති බව.
3. සාමූහික බව හා සරල බව.

22) කෝලාට්ටම් නර්තනය ට සමාන නර්තනයකි.

1. වන්නම්
2. ලී කෙළි
3. කෝලම්

23) නර්තනය, සංගීතය, නාට්‍ය යන තුනම ප්‍රාසාංගික කලා ය. චිත්‍ර කලාව නම්

1. නර්තන කලාවකි
2. දෘශ්‍ය කලාවකි
3. ශ්‍රව්‍ය කලාවකි

24) මනිපුරි නර්තනයේ සංගීතය

1. කර්ණාටක සංගීතය
2. හින්දුස්ථානී සංගීතය
3. බටහිර සංගීතය

25) මනිපුරි නර්තනය උපත ලැබුවේ

1. ආගමික භක්තිය මුල් කර කරගෙනය.
2. විනෝදාස්වාදය මුල්කරකරගෙනය
3. සාමය මුල්කරගෙනය

26) මනිපුරි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම්

1. ගැට බෙරය
2. තබ්ලාව
3. පුංග් බෙරය

27) 'ගෝවින්දය', 'භගවත් ගීතාව' යන කාව්‍යයන්ගේ ගායනා යොදාගත් නර්තන සම්ප්‍රදාය වන්නේ

1. මනිපුරි නර්තනය
2. පහතරට නර්තනය
3. ඔපෙරා නාට්‍ය

28) රාස්ලීලා නර්තනයට තේමා වී ඇත්තේ

1. රාධා ක්‍රිෂ්ණා
2. රාම සීතා
3. ජාලිය ක්‍රිෂ්ණා

29) සුළු මහා දෙතිතේ බෙර පදයකි

1. දොං ජිංත ගත දොංත
2. ජිං ගත ගො ගො
3. දොං ජිං ජිං ජිං ගජිගත

30) 2 + 4 අයත් කවියක කවි පදයකි.

1. වන් නිල්ගෙල නිල් රන්වරලින් තුල් බිගු ඇල්ලා
2. ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
3. අගය වඩන කවි වරුණා

<u>නිවැරැදි පිළිතුරට ✓ ලකුණ ද වැරදි පිළිතුරට ✗ ලකුණ ද යොදන්න.</u>

31) දෙසුළු මැදුම් තුන්තිත 2 + 2 + 3 වේ. ( )

32) දෙසුළු මැදුම් වන්නමකි තුරගා වන්නම. ( )

33) මැදුම් මහ 2 + 4 වේ. ( )

34) මනිපුරි නර්තනයේ රංග වස්ත්‍රාභරණයකි ‘කුමින්’. ( )

35) ලාස්‍ය ලක්ෂණ සහිත ශෘංගාරාත්මක නර්තනයකි මනිපුරි. ( )

<u>කෙටි පිළිතුරු ලියන්න</u>

36) නර්තන කලාව හැදෑරීමෙන් මානසික සුවය ලබා ගැනීමට හැකියාව ඇත. ඒ පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

37) යහපත් දිවි පැවැත්මකට නර්තන කලාව හා බැඳි සාරධර්ම බලපාන ආකාරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

38) විදේශ සංචාරකයින් සඳහා හෝටල් වල සහ සංචාරකයින් විශාල වශයෙන් ගැවසෙන ස්ථානවල සංදර්ශන පැවැත්වීමෙන් ලබන වැදගත් කරුණු 5ක් සඳහන් කරන්න.

39) අන්තර්ජාතික සංස්කෘතික හුවමාරු යටතේ විදේශ රටවලට යෑමට අවස්ථාව ලැබූ නර්තන කණ්ඩායම් තුනක් නම් කරන්න.

40) මුසලඩි වන්නමේ කස්තිරම සහ අඩව්ව ප්‍රස්තාර කරන්න.